ඇලහැර ප්‍රාදේශීය සභාව
පොළොන්නරුව දිස්ත්‍රික්කය

(අ) ගිණුම්කරණ අඩුපාඩු

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 24 දිනද, සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඇලහැර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතයසඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ගබඩා ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කර නොතිබුණි. | අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කළ යුතුවේ. | පිළිතුරු ලැබී නැත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාල සියළුම ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | අදාල ආයතන සමඟ සෘජුවම සම්බන්ධ වී ඊට ඉක්මන් විසඳුමක් ලබාගැනීමට කටයුතු කරමි. |
| (iii) | සභාවට අයත් ඉඩම් 36 ක් තක්සේරු කර, වටිනාකම් හඳුනාගෙන, ගිණුම්ගත කර නොතිබුණි. | සභාවට අයත් ඉඩම් තක්සේරුකර වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී සමීක්ෂණයක් සිදුකිරීමට අපේක්ෂා කරමි. |
| (iv) | ගබඩාවේ ඉතිරිව තිබූ රු.37,500 ක් වටිනා crusher powder 300Kg ක් අවසන් තොගයට ඇතුළත් කර නොතිබුණි. | අවසන් තොග නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළයුතු වේ. | 2019 වර්ෂයේ ආරම්භක තොගයට ඇතුලත් කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව හා අදාල උපලේඛනඅනුව වත්කම් අයිතම 04 ක වටිනාකමේ රු.48,458,435 ක නොසැසඳීමක් පැවතුණි. විස්තර පහත දැක්වේ. | වත්කම් ලේඛනය නිවැරදිවත් යාවත්කාලීනවත් පවත්වා ගතයුතු අතර නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. | නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| ගිණුම් විස්තරය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | උපලේඛන අනුව ශේෂය | වෙනස |
| --- | --- | --- | --- |
| | රු. | රු. | රු. |
| පරිගණක හා උපාංග | 1,236,037 | 1,046,547 | 189,490 |
| යන්ත්‍ර උපකරණ | 10,133,838 | 9,426,459 | 707,379 |
| මෝටර් රථ හා කරත්ත | 191,217,190 | 146,219,823 | 44,997,367 |
| ආයුධ, ආම්පන්න හා මෙවලම් | 3,749,631 | 6,313,830 | 2,564,199 |
| එකතුව | | | 48,458,435 |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.184,952,094 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාල සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | ලේඛන සකස් කිරීමටත් අඩුපාඩු නිවැරදි කිරීමටත් කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම්

-----------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

| | **නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක15 දරන ප්‍රාදේශීයසභාප නත | | | |
| (i) | 24 වගන්තිය | ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන පාරවල්වල සහ පටුමාවත් වල ස්ථිර සලකුණු සහ සීමා ලකුණු කිරිම,සැලැස්ම පිළියෙල කිරීම හා ඒවායේ නාම ලේඛනයක් දක්වමින් දැන්වීම් පල කිරීම සිදුකර නොතිබුණි | පාරවල් හා පටුමාවත්වල ස්ථිර ලෙස සලකුණු සීමා ලකුණු කිරිම සැලැස්ම පිළියෙල කිරීම හා ඒවායේ නාම ලේඛනයේ දක්වමින් දැන්වීම් පල කිරීම සිදුකළ යුතුවේ. | ඉදිරියේදී ඒ අනුව කටයුතු කිරීමට අපේක්ෂා කරමි. |
| (ii) | 60(iii) වගන්තිය | සභාවට අයත් මාර්ග භාවිතා කරමින් ගල්, බොරළු, වැලි හා පස් ප්‍රවාහනය කිරීමේදී අතුරු ව්‍යාවස්ථාවක් සම්මත කර සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රවාහන ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රවාහන ගාස්තු අයකර ගැනීමට අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | ඉදිරියේදී ගල්, වැලි, බොරළු ප්‍රවාහන සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් සකස් කර සම්මත කර ගාස්තු අයකිරීමට කටයුතු කරමි. |
| (iii) | 135 වගන්තිය | වරිපනම් බද්දෙන් නිදහස් පොදු, ආගමික, පුන්‍යකර්ම, අධ්‍යාපනික හා ගෘහ නිදහස් කල යුතු දේපල ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. | වරිපනම් බද්දෙන් නිදහස් කළයුතු දේපල ලැයිස්තුවක් සකස්කල යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | 150 (අ), 152(ආ) හා 159(1)සහ (2) වගන්ති | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.22,238,706 ක හිඟ ආදායම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් සම්බන්ධයෙන් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට අපේක්ෂා කරමි. |
| (ආ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23(ආ) වගන්තිය | කර්මාන්ත 05 ක පරිසර බලපත්‍ර කල් ඉකුත් වී තිබුණද, නව බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සභාව ක්‍රියා නොකිරීම හේතුවෙන්, සභාවට ලැබීමට තිබූ බලපත්‍ර ගාස්තු ආදායම් අහිමි වී තිබුණි. | පරිසර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතු වේ. | කර්මාන්ත 18 අතරින් කර්මාන්ත 13 ක බලපත්‍ර ලබාදී ඇත. |
| (ඇ) | 1988ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති -------------- | | | |
| (i) | රීති අංක 180 | මුදල් හෝ ගබඩා කටයුතු භාරව ක්‍රියාකරන හා ආදායම් එකතු කිරීමේ කාර්යයේ නිරත නිලධාරීන්ගෙන් ඇප ලබාගෙන නොතිබුණි | මුදල් ගබඩා කටයුතු භාරව ක්‍රියාකරන හා ආදායම් එකතු කිරීම් කාර්යයේ නිරත නිලධාරින්ගෙන් ඇප ලබාගත යුතුවේ. | ගබඩා භාර නිලධාරිගෙන් හා ආදායම් එකතු කරන නිලධාරීගෙන් ඇප තැන්පතු ලබාගැනීමට කටයුතු කරමි. |
| (ii) | රීති අංක 194 | ස්ථාවර වත්කම් පිළිබඳව ලේඛන පවත්වාගෙන යාම සහ ඒවා පිළිබඳව වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නියම කර ඇති පී.එස්.45 ආකෘති ප්‍රකාරව වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් පිළිබඳව ලේඛන පවත්වා ගතයුතු අතර වාර්ෂික සමීක්ෂණයක් සිදුකළ යුතුවේ. | ඒ අනුව කටයුතු කරමි. |
| (iii) | රීති අංක 204 | 2017 භාණ්ඩ සමීක්ෂණයේදී භාණ්ඩ වර්ග 27 කට අදාළ අයිතම | ඌනතාවයන් පිළිබඳව පරීක්ෂාකර ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු | ඌනතා පිළිබඳ ඉදිරි තීරණ ගනිමි. |

| | | | | |
|---|---|---|---|---|
| | | 214 ක ඌනතාවයක් අනාවරණය වී තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කළ යුතුවේ. | |
| (iv) | රීති අංක 218 | ප්‍රාදේශීය සභාව සතු ඉඩම් සම්බන්ධයෙන් සමීක්ෂණයක් කර නොතිබුණි. | වාර්ෂිකව සභාවේ දේපල සම්බන්ධයෙන් සමීක්ෂණයක් පැවැත්විය යුතුවේ. | ඉදිරියේදී සමීක්ෂණයක් සිදුකිරිමට අපේක්ෂා කරමි. |
| (ඈ) | ශ්‍රීලංකාප්‍රජාතාන්ත්‍රිකසමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසිසංග්‍රහය<br>----------------- | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | මාණ්ඩලික නොවන නිළධාරියෙකු වෙත අවස්ථා 37 කදී රු.803,650 ක මුදලක් භාණ්ඩ හා සේවා සපයා ගැනීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. | මාණ්ඩලික නොවන නිලධාරීන්ට අත්තිකාරම් ගෙවීම වළකාලිය යුතුවේ. | නිරීක්ෂණය පිළිගතිමි. |
| | | කාර්යය නිමකළ විගසම අදාළ අත්තිකාරම් මුදල නිරවුල් කළයුතු වුවද 2017 අප්‍රේල් 12 සිට 2017 අගෝස්තු 31 දක්වා කාලසීමාවේදී වවුචර් 11 ක් යටතේ ගෙවීම් කරන ලද රු.284,800 ක මුදලක් 2019 පෙබරවාරි 20 වන විටත් පියවා නොතිබුණි. | කාර්ය නිමකළ විගසම අදාළ අත්තිකාරම් මුදල නිරවුල් කළයුතු වේ. | එම වවුචර්පත් වලට අදාල බිල්පත් නිසි පරිදි සම්පූර්ණ කර 2019 වර්ෂයේ අත්තිකාරම් පියවීමට අවශ්‍ය උපදෙස් මේ වන විට ලබාදී ඇත. |
| (ii) | මු.රෙ. 1647 | සමාලෝචිත වර්ෂයේ දී රු.336,979 ක් වැයකර සිදු කරන ලද වාහන අළුත්වැඩියාවලට අදාල විස්තර ලොග් සටහන් | වාහන අළුත්වැඩියාවන්ට අදාළ විස්තර ලොග් සටහන් පොත්වල ඇතුළත් කළ යුතුවේ. | ලොග් සටහන් පොත්වල ඇතුලත් කිරීමට කටයුතු කරමි. |

පොත්වල ඇතුලත් කර නොතිබුණි.

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍යප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,134,529 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,792,441 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැ. 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැ. 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 336,577 | 340,682 | 598,821 | 785,795 | 336,577 | 336,675 | 188,785 | 988,228 |
| (ii) | කුලී | 1,488,000 | 1,336,000 | 1,185,635 | 944,700 | 1,199,700 | 1,272,000 | 671,700 | 790,710 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 800,000 | 983,018 | 983,018 | - | 550,000 | 221,710 | 22,710 | - |
| | එකතුව | 2,624,577 | 2,659,700 | 2,767,474 | 1,730,495 | 2,086,277 | 1,830,385 | 878,195 | 1,778,938 |

2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට සභා බල ප්‍රදේශයෙන් වරිපනම් බදු ලේඛන අනුව අයවිය යුතු හිඟ වරිපනම් මුදල රු.785,795 ක් විය. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පවතින හිඟ අය කිරීමට කටයුතු කරඇත. |
| (ආ) | කාලානුරූපීව තක්සේරු නොකර, 2004 වර්ෂයේ සිදුකරන ලද වරිපනම් තක්සේරුව පදනම් කරගෙන වරිපනම් අයකර තිබුණි. | වර්ෂ පහකට වරක් වරිපනම් තක්සේරු කළ යුතුවේ. | සභාවට අයත් වරිපනම් දේපල තක්සේරු කරදෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත මේ වන විට ඉල්ලීම් කර ඇත. |
| (ඇ) | ක්ෂේත්‍ර පරික්ෂාවේදී හඳුනාගන්නා ලද කසල බදු අයවිය යුතු ආයතන 459 කින් අයවිය යුතු හිඟ කසල බදු ආදායම රු. 180,150 ක් විය. | කසල බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ මැයි සිට කසල බදු ලබා ගැනීමට අපේක්ෂා කරමි. |

2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව යටත් පිරිසෙන් වසර 05 කට වරක්වත් තක්සේරුගත බදු කුලිය සංශෝධනය කල යුතු වුවත්, සභාව විසින් 2008 වර්ෂයෙන් පසුව තක්සේරුවක්<br><br>සිදුනොකර2017 වර්ෂයේදී සිදුකරන ලද තාවකාලික තක්සේරුවක් පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය සඳහා ද කඩකුලී අයකර තිබුණි. | වසර 05 කට වරක්වත් තක්සේරුගත බදු කුලිය සංශෝධනය කළ යුතුවේ. | ඉදිරියේදී තක්සේරු දෙපාර්තමේන්තුව හරහා නව තක්සේරුවක් සිදුකිරීමට ඉල්ලීම් කර ඇත. |
| (ආ) | සභාවේ කඩ කාමර ගිවිසුම්වලින් වැඩි ප්‍රමාණයක් වසර 10 කට පෙර ගිවිසගත් ඒවා වූ අතර, කඩ කාමර 70 ක ගිවිසුම් යාවත්කාලීන කිරීමට හා නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය පරිදි කඩකාමර ගිවිසුම් යාවත්කාලීන කළයුතු අතර අවශ්‍ය අවස්ථාවන්හි නව ගිවිසුම් වලට එළඹිය යුතුවේ. | නව ගිවිසුම් ඇති කරගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ජේ.සි.බි. යන්ත්‍රය, මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය හා ගල් රෝල කුලී පදනම මත සේවයේ යොදවා ඇතත්, ඒ වෙනුවෙන් අයවිය යුතු රු. 532,350 ක මුදල, 2019 පෙබරවාරි 27 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගත යුතුවේ. | ලබාදී ඇති පිළිතුර අපැහැදිලි වේ. |
| (ඈ) | දෙහිවත්ත සතිපොළ භූමියෙහි කඩ කාමර සඳහා අයවිය යුතුව තිබූ රු.4,374,750 ක ටෙන්ඩර් මුදලක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් හිඟව පැවතුණි. | ලැබිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගත යුතුවේ. | පිළිගනිමි. 2019.05.31 වන විට හිඟ මුදලින් රු.1,302,550 ක් අයකර ඇත. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන්2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.11,864,320 ක් හා 2018 ජනවාරි 01 දිනට සභාවට ලැබිය යුතු හිඟ මුද්දර ගාස්තු ආදායම රු. 655,803 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කලයුතුවේ. | පෙන්වා දී ඇති කරුණු හා එකඟ වෙමි. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ සභාව විසින් ඉටුකල යුතු කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, | අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු කරුණු හඳුනාගෙනඅතුරු | ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා පනවා අමාත්‍යවරයා වෙත යොමුකර ගැසට් |

| | | |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 11 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | පත්‍රයේ පල කිරීමට කටයුතු කරමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කළ යුතුවේ. | 2019 ජූලි සිට දෙසැම්බර් දක්වා මාස 06 ක් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සැදීමට කටයුතු කර ඇත. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ දෛනිකව රැස්වන ටොන් 03 ක පමණ ඝන අපද්‍රව්‍ය තොගය පරිසර හිතකාමීව බැහැර කිරීම සඳහා සභාව වෙත අවශ්‍ය භෞතික හා මානව සම්පත් සමාලෝචිත වර්ෂ අවසානය වන විටද සපයාගෙන නොතිබුණි. | පරිසර හිතකාමීව අපද්‍රව්‍ය තොග බැහැර කළ යුතු අතර ඊට අවශ්‍ය සම්පත් සපයාගත යුතුවේ. | භූමිය ලබාගැනීමට 2014 සිට ඇළහැර ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලීම් කල ද, නීත්‍යානුකූලව ලබාදීමට මෙතෙක් කටයුතු කර නොමැත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර 04 ක ගිවිසුම්කරුවන් විසින් සභාවේ අනුමැතියකින් තොරව නව ඉදිකිරීම් සිදුකර තිබුණි. | බදුදීමේදී විධිමත් ගිවිසුම් මඟින් ලබාදිය යුතුවේ. | කුලී මුදල් අයකර ගැනීමට හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට රෝහල පාර වම අංක 01 කඩ කාමරයේ හිඟ බදු කුලිය රු. 69,000 ක් වූ අතර බකමූණ සතිපොල භූමිය අංක 01 කඩ කාමරයෙන් අය විය යුතු හිඟ බදු කුලී ආදායම රු.12,000ක් විය. | හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ කුලී මුදල් අය කරගැනීමට හා නොගෙවන්නන්ට එරෙහිව නීති මඟින් කටයුතු කිරීම මේ වන විට සිදුවෙමින් පවතී. |

3.3 වත්කම් කළමනාකරණය

(අ) නිශ්ක්‍රීය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු සහල් පිටි සැකසුම් නිෂ්පාදන යන්ත්‍රයක් හා ඩබල් කැබ් රථයක් නිශ්කාර්යව පැවතුණි. | නිශ්කාර්ය වත්කම් ඵලදායි ලෙස උපයෝජනය කළ යුතුවේ. | 2018 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව කටයුතු කරන බව දන්වමි. |

4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු ආදායම් හා වියදම් ප්‍රභවයන් හඳුනාගෙන ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් ආදායම් විෂයයන් 5 ක සියයට 48-56 අතර විචලනයක් පැවති අතර වියදම් විෂයයන් 08 ක සියයට 10-134 අතර විචලනයක් පැවතුණි. | ආදායම් හා වියදම් ප්‍රභවයන් නිසිපරිදි හඳුනාගෙන අයවැය සකස් කළ යුතුවේ. | 2019 වෙනුවෙන් සකස් කරන ලද අයවැය සහභාගික අයවැයක් ලෙස සකස් කිරීමට පියවර ගතිමි. |

4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයන් සිදුකළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

4.3 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක එන්සීපි/සීඑස්/01 විගණන හා 2016 මැයි 11 දිනැති | විගණන හා කළමනාකරණ කමිටු | 2019 විගණන හා කළමනාකරණ කමිටු |

| | | |
|---|---|---|
| ලිපිය මඟින් විගණන හා කළමනාකරණ කමිටු සෑම මාස 02 කට වරක් පැවැත්විය යුතු බව දක්වා ඇතත්, 2018 වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි. | නිසි පරිදි පැවැත්විය යුතුවේ. | පැවැත්වීමට කටයුතු කරමි. |

4.4 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

---------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | -------------- | ------------------------- |
| (අ) | දුර ගමන් බස් නැවතුම්පල හා වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේව්‍යාපෘතිය සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබූ අතර යෝජිත භූමියේ කළුගල කඩා ඉවත් කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.2018 දෙසැම්බර් 31 දින වන විට භූමියේ පිහිටි කළුගල කැඩීම සඳහා රු.13,163,228 ක් වැයකර තිබුණු නමුත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් දුරගමන් බස් නතර කිරීම සඳහා ඇලහැර විවිධසේවා සමූපකාර සමිතියට අයත් භූමියක් තෝරාගෙන රු.මිලියන 50 ක් වැයකර බස් නැවතුම්පලක් ඉදිකිරීමට තීරණය කර තිබුණු බැවින් මේ සඳහා වැය වූ සියළුම මුදල් නිශ්කාර්ය වී තිබුණි. තවද, යන්ත්‍ර භාවිතා කර ගල විද වෙඩි බෙහෙත් දමා පිපිරවීමේ කාර්යය සඳහා නිරත වූ පුහුණු කම්කරුවෙකුට හා නුපුහුණු කම්කරුවකුට මාස 15 ක කාලයකදී රු.12,329,136 ක ගාස්තුවක් ගෙවීම ප්‍රශ්නගත විය. රු.9,904,960 ක ගාස්තු අයකර ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් සභාව වෙත එන්තරවාසියක් එවා තිබුණි. | නිශ්කාර්ය වියදම් ඇ තිනොවන ආකාරයෙන් කටයුතු කළ යුතුවේ. සභාවේ ධාරිතාවය අනුව සිදුකළ හැකි ව්‍යාපෘති ආර්ථික බවින් යුතුව ක්‍රියාත්මක කළ යුතුයි. | නිරීක්ෂණය පිළිගනිමි. |